# 2025.06.27 දින මාසික මහ සභා රැස්වීම් වාර්තාව

සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව
මාසික මහ සභා රැස්වීම් වාර්තාව
ස්ථානය :- සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය
දිනය :- 2025. ජුනි මස 27
වේලාව :- පෙ.ව.9.00.

<u>සහභාගීත්වය</u>

01. ඩබ්.වී. සුසන්ත ප්‍රදීප් කුමාර මැතිතුමා - ගරු සභාපති
02. පී.කේ. අසංක ඉඳුනිල් මැතිතුමා - ගරු උප සභාපති
03. ජී.එම්. සුනිල් ප්‍රේමරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
04. ඩී.එම්. කමල් ගුණරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
05. ටී.ඩබ්. උපාලි වසන්ත කුමාර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
06. ජී. ශානිකා ප්‍රියදර්ශනි මැතිණිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී
07. කේ.එම්.ධර්මදාස බණ්ඩාර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
08. ආර්.එම්. අජිත් කුමාර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
09. කේ.එම්. අජිත් පුෂ්ප නන්දන මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
10. කේ.ආර්.එම්. අමරවංශ මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
11. එල්.එච්.හර්ෂනි මධුමාලී මැතිණිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී
12. බී.බී.සිරිත් ප්‍රියදර්ශන පෙරේරා මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
13. ඩබ්.ඒ. පුෂ්පජිත් මධුසංඛ අමරසිංහ මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
14. එච්.එම්. මහේෂ් ඉන්දික බණ්ඩාර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
15. එම්.ඒ. චාන්දන බණ්ඩාර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
16. ආර්. එම්. අබේපාල මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
17. කේ.එම්.වසන්ත රංජිත් කුමාර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
18. ඩී.එම්. මධුරාණි දිසානායක මැතිණිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී
19. ආර්.එම්. හේමලතා මැණිකේ මැතිණිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී
20. එල් .එල්. සුජිත් කුමාර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී
21. ආර්.එම්. ඉන්ද්‍රාවති මැතිණිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී

# 2025.06.27 දින මාසික මහ සභා රැස්වීම් වාර්තාව

සියඹලාණ්ඩුව ප්‍රාදේශිය සභාවට අභිනවයෙන් තේරි පත්වූ ගරු මන්ත්‍රී මණ්ඩලය සම්බන්ධ කර ගනිමින් පවත්වන ලද මංගල මහ සභාවේ සභා වාර්තාව පහත දැක්වේ. මෙම රැස්වීම ගරු සභාපති ඩබ්.වී. සුසන්ත ප්‍රදීප් කුමාර මැතිතුමාගේ මුලිකත්වයෙන් පවත්වන ලදී. පළමුව පැමිණ සිටි සියලුම දෙනා පිළිගත් අතර න්‍යායපත්‍රානුකූලව ඉන්පසු වැඩ කටයුතු ආරම්භ කරන ලදි. ඒ අනුව පසුගිය විශේෂ මහ සභවේ සභා වාර්තාව අනුමත කිරිමේ අවස්තාව එළඹින. එහිදි කේ.එම්. අජිත් පුෂ්ප නන්දන මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදි. මේ සම්බන්ධයෙන් සභාවේ කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවුණි.

මෙහිදි එල්. එල්. සුජිත් කුමාර මන්ත්‍රීවරයා ප්‍රකාශ කර සිටියේ ඔහුගේ නම ඇතුලත් කර ඇති කාරක සභාව වෙනස් එකක් බවත් එය නිවැරදි කළයුතු බවත්ය. මේ සම්බන්ධව ගරු උප සභාපතිතුමා හා ගරු කේ.එම්.ආර්. අමරවංශ මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටියේ ඔහු පත්කර ඇති කමිටුව කාර්මික සේවා පිළිබඳ කාරක සභාව බවත් අතපසු විමකින් වෙනත් කමිටුවක අසුන් ගැනිමක් සිදු වී ඇති කමිටුවේ ගැටලුවක් නොමැති බවත්ය. මෙහිදි ගරු සභාපතිතුමා විසින් පළමුවෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටියේ මෙය උත්තරීතර ස්ථානයක් බවත් සියලුම දෙනා ජංගම දුරකථන ක්‍රියා විරහිත කර හෝ සයිලන්ස් මුඩ් සකසා ගනිමින්. සාකච්ජා කරන කරුණු පිළිදව හොඳ අවබෝධයකින් යුතුව ඇහුන්කම් දි සිටිය යුතුයි බවයි. ඉන් අනතුරුව සභාපතිතුමා විසින් විශේෂ නිවේදන ඉදිරිපත් කරන ලදි. ඒ අනුව අත්‍යාවශ්‍යයෙන්ම ඉදිරි කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා පහත සඳහන් කමිටු සඳහා සාමාජිකයින් පත්කරගත යුතු බව ප්‍රකාශ කරන ලදි.

**01. <u>ප්‍රසම්පාදන කමිටුව</u>**

මෙම කමිටුව සඳහා සාමාජික මණ්ඩලය සුදුසු බවට කේ.ආර්.එම් අමරවංශ මන්ත්‍රීතුමා යෝජනා ක අතර එම යෝජනාව කේ.එම් අජිත් පුෂ්පනන්ද මන්ත්‍රීවරයා ස්ථිර කරන ලදි. ප්‍රසම්පාදන කමිටුව පහත පරිදි වේ.

01. ගරු සභාපති - ඩබ්.වී සුසන්ත ප්‍රදිප් කුමාර මැතිතුමා
02. උප ගරු සභාපති - පී.කේ.අසංක ඉඳුනිල් මැතිතුමා
03. සභා ලේකම් - ඩී.එම් අනුර දිසානායක මහතා
04. කාර්මික නිලධාරි - කේ.එම් චන්දිමා කුමාරි මිය
05. විෂය භාර නිලධාරි

වෙනත් යෝජනා නොතිබු අතර සභාවේ එකඟතාවය ලබා දෙන ලදි.

02. <u>පරිසර කමිටුව</u>

මෙම කමිටුව සඳහා පහත සාමාජික මණ්ඩලය සුදුසු බවට ගරු මන්ත්‍රී ඩී.එම්. කමල් ගුණරත්න මන්ත්‍රීතුමා විසින් කළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.ආර්.එම්.අමරවංශ මන්ත්‍රීතුමා ස්ථිර කරන ලදි. විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවු බැවින් සභාවේ එකඟතාවය ලබාදෙන ලදි. පරිසර කමිටුව පහත පරිදි වේ.

01. ගරු සභාපති - ඩබ්.වී. සුසන්ත ප්‍රදිප් කුමාර මැතිතුමා
02. ගරු මන්ත්‍රීණි - ජේ.ශනිකා ප්‍රියදර්ශනි මන්ත්‍රීණි
03. සභා ලේකම් - ඩී.එම්. අනුර දිසානායක මහතා
04. කාර්මික නිලධාරි - කේ.එම්. චන්දිමා කුමාරි මිය
05.විෂයභාර නිලධාරි

03.<u>නිවාස හා සැලසුම් කමිටුව</u>

මෙම කමිටුව සඳහා පහත සාමාජික මණ්ඩලය සුදුසු බව ජේ. ශනිකා ප්‍රියදර්ශනි මන්ත්‍රීතුමිය යෝජනා කළ අතර කේ.එම්. අජිත් පුෂ්ප නන්දන මැතිතුමා ස්ථිර කරන ලදි. මේ සම්බන්ධව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවු බැවින් සභාවේ එකඟතාව ලබාදෙන ලදි.

01. ගරු සභාපති - ඩබ්.වී. **සුසන්ත ප්‍රදීප් කුමාර මැතිතුමා**
02. ගරු මන්ත්‍රී - කේ.ආර්.එම්. අමරවංශ මැතිතුමා
03. සභා ලේකම් - ඩී.එම්. අනුර දිසානායක මහතා
04. කාර්මික නිලධාරි - කේ.එම්. චන්දිමා කුමාරි මිය
05. විෂය භාර නිලධාරි

04.<u>ආයතනයට අදාළ නඩු කටයුතු වෙනුවෙන් කරුණු දැක්වීම සහ අධිකරණයේ පෙනී සිටීම.</u>
සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවට පවතින නඩු වෙතොත් ඒ සඳහා කරුණු දැක්වීම හා අධිකරණයේ පෙනී සිටීම සඳහා

01.ගරු සභාපති - ඩබ්.ඒ. සුසන්ත ප්‍රදීප් කුමාර මැතිතුමා
02. උප ගරු සභාපති - පී.කේ.අසංක ඉඳුනිල් මැතිතුමා
03. සභා ලේකම් - ඩී.එම්. අනුර දිසානායක මහතා ද
04. සභාපතිතුමා විසින් බලය පවරන වෙනත් නිලධාරියෙක්ද සුදුසු බව ගරු ටී.ඩබ්.යූ. උපාලි වසන්ත කුමාර මන්ත්‍රීතුමා යෝජනා කළ අතර එල්.එච්.හර්ෂණී මධුමාලි මන්ත්‍රීතුමිය ස්ථිර කරන ලදි. සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් මහ සභාවේ එකඟතාවය මේ සඳහා ලබාදෙන ලදි.

05. <u>අවිනිශ්චිත හා හදිසි අවස්ථාවලදී ක්ෂේත්‍රයේ යම් යම් පරිශ්‍රයන්ට ප්‍රවේශ වීමේ බලය ලබා දීම</u>.

සියඹලාණ්ඩුව කොට්ඨාශය තුළ කිසියම් හෝ පරිශ්‍රයක අවිනිශ්චිත අවස්ථාවක හෝ හදිසි අවස්ථාවක විමර්ශනය කිරීම සඳහා ප්‍රාදේශීය සභාව වෙනුවෙන් මැදිහත්ව කටයුතු කළයුතු අවස්තා පවතින බැවින් ඒ සඳහා සහභාගී වීමට ගරු සභාපති ඩබ්.ඒ. සුසන්ත ප්‍රදීප් කුමාර මැතිතුමා ද පී.කේ. අසංක ඉඳුනිල් මැතිතුමා, ගරු සභාපති දැනුම් දීම හා උපදෙස් මත ගරු මන්ත්‍රීවරයෙක් හෝ නිලධාරියෙක් යෙදවීම සුදුසු බව කේ.ආර්.එම්. අමරවංශ මන්ත්‍රීතුමා යෝජනා කළ අතර ගරු සිරිත් ප්‍රියදර්ශන පෙරේරා මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදි. මේ සඳහා සභාවේ පූර්ණ එකඟතාවය ලබාදෙන ලදි.

06.<u>තාක්ෂණික ඇගයීම් කමිටුව</u> .
සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවට අදාළ මිලදී ගැනීම් සේවා සැපයීම් හා සම්බන්ධයෙන් වන තාක්ෂණ ඇගයීම් කමිටු සාමාජිකයින් ලෙස ගරු කේ.එම්.ධර්මදාස බණ්ඩාර මන්ත්‍රීතුමා විසින් පහත සඳහන් නම් යෝජනා කරන ලදී.
01. කාර්මික නිලධාරි - ඩබ්.ඒ ධනුක නිවන්ත මහතා
02. ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි - ඩී.එම්.එන් සරෝජනී දිසානායක මිය
03. විෂය නිලධාරි - කේ.කේ.රේණුක පුෂ්ප කුමාරි මිය
04. අවස්ථානුකූලව අදාල විෂයට සම්බන්ධ ප්‍රාමාණික දැනුම් ඇති නිලධාරියෙක් වශයෙනි. ( ගරු සභාපතිතුමාගේ එකඟතාවය මත) සුදුසු බවට ගරු මන්ත්‍රී කේ.එම්.අජිත් පුෂ්ප නන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

07. <u>කොම්පෝස්ට් අංගනයේ ඉදිකිරීම සම්බන්ධව තාක්ෂණික ඇගයීම් කමිටුව.</u>

ප්‍රාදේශීය සභාවට අයත් කොම්පෝස්ට් අංගනයේ සංවර්ධන කටයුතු කිරීම වෙනුවෙන් PSDG ප්‍රතිපාදන යටතේ මුදල් වෙන්වී ඇති අතර ඊට අදාල කර්මාන්තයේ තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් ලෙස

01. පළාත් පාලන දෙපාර්තමේන්තු ප්‍රධාන ඉංජිනේරු - ආර්.එම්.ඒ.එස්.රත්නායක මහතාද
02. කාර්මික නිලධාරි - ඩබ්.ඒ ධනුක නිවන්ත මහතා
03. විෂය නිලධාරි - කේ.කේ.රේණුකා පුෂ්ප කුමාරි මිය

සුදුසු බව ආර්.එම්.අජිත් කුමාර මන්ත්‍රීතුමා යෝජනා කල අතර කේ.එම්. අජිත් පුෂ්ප නන්ද මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදි. මේ සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ බැවින් සභාවේ එකඟතාවය ලබා දෙන ලදි

08.**<u>ප්‍රාදේශීය සභාව විසින් භුක්ති විදි පැරණි පුස්තකාල ගොඩනැගිල්ල අත්පත් කර ගැනිම.</u>**

සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව විසින් ඉතා දිර්ඝ කාලයක සිට භුක්ති විදි සියඹලාණ්ඩුව පොළ භූමිය අසල පිහිටි පුස්තකාල ගොඩනැගිල්ල දැනට ව්‍යාපාරිකයෙක් විසින් රෙදි වෙළඳ සැලක් පවත්වාගෙන යන බවත්, එහෙත් දැනට ප්‍රාදේශීය සභා කාර්යාල භූමියේ ඉදිකර ඇති පුස්තකාල ගොඩනැල්ල තුල ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති නිසා සංවර්ධන කටයුතු කිරිමට මේ හේතුව මත අපහසුව පවතින බැවින් එය නැවත පොළ භූමිය ආශ්‍රිතව පිහිටි පැරණි පුස්තකාල ගොඩනැගිල්ල තුලම ස්ථාපිත කිරිම සුදුසු බවත් ගරු මන්ත්‍රී ඩී.එම්. කමල් ගුණරත්න මන්ත්‍රීතුමා යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ජී. ශනිකා ප්‍රියදර්ශනි මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කරන ලදි. මේ පිළිබඳ සභාවේ ඒකමතිකව එකඟතාවය ලබාදෙන ලදි. මෙහිදි ගරු කේ.ආර්.එම්. අමරවංශ මන්ත්‍රීතුමා ප්‍රකාශ කලේ දැනට රෙදි වෙළඳාම පවත්වාගෙන යන බදුකරු හිතා මතා ගිවිසුම්ගත විමෙන් ඉවත් වී කටයුතු කිරිම තුළ සභාවට විශාල හිඟ ආදායමක් ලබා ගැනිමට ඇති බවත් විධිමත්ව ගිවිසුම්ගත නොවි සභාව සතුව තිබූ දේපලක් විවිධ කරුණු කියමින් බලහත්කාරයෙන් පරිහරණය කිරිම සභාවේ ගෞරවයට සහ පෞරුෂයට, අභිමානයට හානියක් වන බවත්, මෙවැනි කටයුතු සිදු නොවියයුතු බවත් පවසන ලදි. ඒ අනුව ඉඩම් බලධාරියා වන ප්‍රාදේශිය ලේකම් විසින් මෙම භූමි පරිශ්‍රය විධිමත්ව පවරා ගැනිමටත් ඉන් අනතුරුව එම ගොඩනැගිල්ලේ ඊ පුස්තකාල සේවාවන්, පොත් කියවිම් ශාලාවක් පවත්වාගෙන යාම සුදුසු බවත් යෝජනා කරන ලදි . එම යෝජනාව ගරු කේ.එම්.වසන්ත රංජිත් කුමාර මැතිතුමා ස්ථිර කරන ලදී. මෙහිදි ගරු ටී.ඩබ්. උපාලි වසන්ත කුමාර මැතිතුමා දන්වා සිටියේ මෙහි පවතින වර්තමාන තත්වය ලේකම්වරයාට ඉදිරිපත් කරන ලෙසයි. එහිදි ගරු සභාපති ප්‍රකාශ කර සිටියේ ඉදිරි සභාවකට මේ පිළිබඳ නිවාස හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව විසින් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසයි.

09. ආයතනය සතු කසල අංගනය ගොඩගැසි ඇති කොම්පෝස්ට් පොහොර සම්බන්ධව සභාවේ යෝජනාවක් අපේක්ෂා කරන බව සභාපතිවරයා විසින් පවසන ලදි. එහි දී උපසභාපතිවරයා පැවසුවේ පොහොර අලෙවිය ඉතා හොඳ ආදායම් මාර්ගයක් බවත් මෙම පොහොරවල ගුණාත්මක භාවය පිළිබඳ ප්‍රශ්නයක් පවතින බවත් දැනට ටොන් 15 ක පමණ ප්‍රමාණයක් ගොඩගැසි ඇති බවය. අලෙවි කිරිම සඳහා මෙහි ගුණාත්මක භාවය වැඩි කළ යුතුය. එබැවින් දැනට පවතින තත්වය අනුව 01kg ක මිල රු.20.00 ක් වැඩි බවත්, එම මුදලට බාහිර පාර්ශවයට පොහොර ලබාදිම අපහසු බවත්, මෙම අංගනය සංවර්ධනය කිරිම යෙදි ඇති බැවින් එම ස්ථානයෙන් කඩිනමින් මෙම තොගය ඉවත් කළයුතු බැවින් ඡන්ද කොට්ඨාශ 14 තුළම අවශ්‍යතාවය මත බෙදා හැරිමට කටයුතු කරන ලෙස සියලු දෙනාම දැනුවත් කරන ලදි. එලෙසම දැනට රු.20.00 ක් වන පොහොර 01kg මිල මෙම සුවිශේෂි තත්වය මත ඉන් අඩක් වන රු10.00 ක් මිලකට අලෙවි කිරිමට අවස්ථාව සලසා දිය හැකි බවද සභාව තීරණය කරන ලදි. සේවකයින් ඉතා හොඳ පුහුණුවක් ලබා දිම සුදුසු බව ගරු ආර්.එම්. ඉන්ද්‍රාවති මන්ත්‍රී තුමිය ප්‍රකාශ කරන ලදි. එලෙසම හොඳ ඇසුරුමක ඇසුරුම් කර අලෙවි කිරිම තුළින් ආදායම වැඩි කරගත හැකි බවද පවසන ලදි. සභාපතිතුමා පැවසුවේ දැනටමත් එවැනි ඇසුරුම් වල පොහොර ලබාදෙන බවයි. කේ.එම්. වසන්ත රංජිත් කුමාර මන්ත්‍රීතුමාප්‍රකාශ කළේ කාබනික පොහොර භාවිතා කරන අයගෙන් මිල ගණන් කැඳවා ටෙන්ඩර් මඟින් මෙම පොහොර තොගය ලබා දිමට කටයුතු කිරිම සුදුසු බවයි. ගරු ටී.ඩබ්. උපාලි වසන්ත කුමාර මන්ත්‍රීතුමා ප්‍රකාශ කලේ නියමිත ප්‍රමිතියක් නැති නිසා ඉල්ලුමට ගැටළුවක් වී ඇති බවත්, කොට්ඨාශයේ පැල තවාන් වලට අඩු මුදලට පොහොර ලබා දිමටත් 2 kg බැගින් ඇසුරන සකස්කර අලෙවි කිරිම සුදුසු බවයි. ගරු ඩබ්.ඒ. පුෂ්පජිත් මධුසංක අමරසිංහ මන්ත්‍රීතුමා ප්‍රකාශ කලේ ප්‍රමිති සහතිකයක් නොමැතිව පොහොර ලබාදිමේදි ගැටළුවක් පවතින බවත්, එම සහතික ලබා ගැනිමට රු.50,000.00ක ආසන්න මුදලක් වැයවන බවත්ය, ඒ නිසා සියලු ආයතන දැනුවත් කර ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මඟින් උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු කිරිම සුදුසු බවයි. 2025.07.31 වන විට කසළ අංගනයේ සියලු ඉදිකිරිම් අවසාන කලයුතු බැවින් පොළවල් ආශ්‍රිතව පොහොර අලෙවි කිරිමට කටයුතු කිරිමට පියවර ගනිමු. තැනට අපි සමඟ පොහොර ලබා ගණන ඉල්ලුම්කරුවන් යම් ප්‍රමාණයක් සිටින බවත්, ඔවුන්ව දිරි ගන්වමින් ආදර්ශ ගොවිපලවල් හදා පොහාර අලෙවි කරමි.එලෙසම අපේ පොහොර පිළිබඳ බොහෝ පිරිසක් දන්නැ .එනිසා සංවර්ධන නිලධාරින් දැනුවත් කර ඔවුන් මඟින් ගම්මු දැනුවත් කර අලෙවිය වැඩිකර ගනිමු. මෙහිදි ගරු සභාපතිතුමා ප්‍රකාශ සිටියේ කාර්මික සේවා පිළිබඳ බොහෝ පිරිසක් දන්නැ .එනිසා සංවර්ධන නිලධාරින් දැනුවත් කර ඔවුන් විසින් ගම්මු දැනුවත් කර අලෙවිය වැඩි කර ගමු .මෙහිදි ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ කාර්මික සේවා පිළිබඳ කාරක සභාවට මෙම සාධණිය තොරතුරු ඉදිරිපත් කර වාර්තාවක් ලබා ගැනිමට කටයුතු කරමු යන්නයි.

## 10.ප්‍රදේශයේ පවතින කැලි කසල අවම කිරිම.

සියඹලාණ්ඩුව නගරය තුල හා අනෙකුත් උප නගරවල කසල බැහැර කිරිමේ අක්‍රමවත් වුවත් ඒ සඳහා බවත් සභාවේ අදහස් ලබාගත යුතු බවත් ගරු උපසභාපතිතුමා විසින් පවසන ලදි. ඔහු තවදුරටත් ප්‍රකාශ කළේ දැනට සියඹලාණ්ඩුවේ වරිපනම් කලාප ස්ථාපිත කර නොමැති බැවින් කසල ඉවත් කිරිමට ආයතනය විසින් අත්‍යවශයෙන්ම බැඳි නොමැති බවයි. විශේෂයෙන්ම වෙළඳ ප්‍රජාව සිතාගෙන සිටින්නේ සභාව විසින් කසල ඉවත් කිරිම සිදු කලයුතු බවයි. අප එම මතය වෙනස් කළයුතුයි. අප මෙම කටයුතු කරන්නේ සේවාවක් ලෙසින්. අප නියමු ව්‍යාපෘතියක් වශයෙන් clean srilanka වැඩ සටහන යටතේ සියඹලාණ්ඩුව නගරය සිමාව තුළ හැඩ ඔය පාලම අසල සිට තැපැල් කාර්යලය දක්වාත් පොතුවිල් මාර්ගයේ ගුණපාල මුදලාලිගේ වෙළඳ සැළ දක්වාත් සියළු පාර්ශවයන් සම්බන්ධ කර ගෙන ශ්‍රමදානයක් සිදු කර සියලු දෙනාගේ එකඟතාවයෙන් කොන්දේසි මාලාවක් සකස්කර ගැනිම සුදුසු බවත් එම කොන්දේසි උල්ලංඝනය කරන කවරෙකුටම හෝ නිතිය ක්‍රියාත්මක කිරිමට කටයුතු කරන බව පවසන ලදි. ව්‍යාපාරිකයෙක් බැවින් මට මෙහි ඍජු බලපෑම එන්න පුළුවන් පිටස්තර පැමිණ මෙම කොට්ඨාශයේ වෙළදාම් කරන ජංගම හා පදික වෙළදුන් ඉවත් කරන්න කටයුතු කරමු. එහෙත් හදුනාගත් අත්‍යවශ්‍ය සුදුසු වෙළඳුන්ට අවස්ථාවන් ලබා දෙන්න ඕන. මෙය බැඳි ප්‍රශ්නයක් සේ සලකා කටයුතු කරමු. ඉදිරියේදි මෙම ප්‍රදේශ වරිපනම් කලාප කිරිමට කටයුතු කරමු. එලෙසම මෙම නියදිය නියමු ව්‍යාපෘතියක් ලෙස සිදු කර නගරය ස්ථායිකරණය කරමු. මෙහිදි ගරු කේ.ආර්.එම්. අමරවංශ මැතිතුමා  විසින් ප්‍රකාශ කළේ මෙය ඉතා කාලෝචිත ක්‍රියාවකි. අන්තර් ආයතන සම්බන්ධ කරගෙන කටයුතු කිරිම සුදුසු බව ස්ථිර කරන ලදි. මෙහිදි ගරු ආර්.එම්. ඉන්ද්‍රාවති මැතිණිය  ප්‍රකාශ කළේ දොඹගහවෙල නගරයේ මෙවැනි ගැටලුවක් පවතින බවත් පළමුව ශබ්ද විකාශන මඟින් දැනුවත්කර නිසි ලෙස තෝරා වෙන් කර දෙනු ලබන කසල පමණක් ලබා ගැනිමට පියවර ගතයුතු බවටත් කසල එකතු කරන සිමාව ලියන්ගොල්ල හංදිය දක්වා ව්‍යාප්ත කිරිම සුදුසු බවයි. දොඹගහවෙල පාසල අසල ඉතා අවධිමත් තත්වයක් තිබෙනවා. පාසල් ළමුන් දැනුවත් කර නගරය අලංකාර කිරිමට කටයුතු කරමු. මෙහිදි ගරු සභාපතිතුමා ප්‍රකාශ කලේ පිටස්තර එකතු වන සියලු කසල සියඹලාණ්ඩුව නගරයට ර ගෙන එන තත්වයක් පවතින බවත්, වෙන් කර කසල ලබා දිමට ජනතාව අතර භාවිතාවක් නොමැති බවත් දැනගත හැකි තත්වයක් පවති. මෙම තත්වය පිළිබඳ ආයතන සියල්ල දැනුවත් කරමු. මෙම තත්වයන් පිළිබඳ පරිසර කාරක සභාව මඟින් සාකච්ජා කර අවශ්‍ය දැනුවත් කිරිම් කරමු.

## 11. ප්‍රදේශයට බලපාන තවත් ගැටලුවක් වන්නේ විදි පහන් ගැටළුවයි.

කොට්ඨාශය පුරා විදි පහන් 1500 කට වැඩි ප්‍රමාණයක් සවි කර ඇතත්, දැනට යාවත්කාලිනව ක්‍රියාත්මක වන්නේ 300 කට ආසන්න ප්‍රමාණයකි. මහකළුගොල්ල ආදි ප්‍රදේශවලට වන අලින්ගෙන් සිදු වන හානි නිසා විදි පහන් අත්‍යවශ්‍යයි. විදි පහන් සවි කිරිමේ දි අනවශ්‍ය තැන් රාශියක සවි කර ඇති බවට අපට දැනගන්න පුළුවන්. ඒ පිළිබඳව සොයා බලා අත්‍යවශ්‍යම තැන් වලට ඒවා යොදවමු. මේ පිළිබඳව සියලුම මන්ත්‍රීවරුන් අවධානයට ගන්නා ලෙස ඉල්ලා සිටිනවා. අපගේ ගැටළුව ජනතාවට අදාළ නැහැ. ඒ නිසා දැන් අපි හොඳ සැලැස්මක් සොයමු . මෙහිදි ගරු උපසභාපතිතුමා ඌණ පූර්ණයක් එකතු කරමින් පවසා සිටියේ අප කවුරුත් පක්ෂග්‍රාහි නොවි දේශපාලන කෝණයකින් නොබලා යෝජනා ඉදිරිපත් කිරිම අවශ්‍ය බවත් විදි පහන් සඳහා විශාල වියදමක් දැරිය යුතු බවත්, අපි ඒ අංශයෙන් වඩාත් සාර්ථක තැනක නොමැති බවත්ය. අපි දරණ පිරිවැය මේ සඳහා විශාල බැවින් වසම් 48 තුලම අක්‍රිය බල්බ හදුනාගෙන අත්‍යවශ්‍ය ඒවා සක්‍රීය කරමු. ආදර්ශ නියමු ව්‍යපෘතියක් ලෙස නගර ආශ්‍රිතව රාත්‍රියට ඉබේ දැල්වෙන LDR බල්බ ස්විච් යොදා විදි පහන් සවිකිරිමට පියවර ගනිමු. ඒ  සඳහා බල්බ 500 කුත් LDR ස්විච් 200 කුත් මිලදි  ගැනීම ගරු උපසභාපතිතුමා  විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු කේ.එම්.අජිත් පුෂ්පනන්ද මැතිතුමා ස්ථිර කරන ලදි. ඒ සඳහා සභාවේ පූර්ණ එකඟකාවය හිමිවිය මෙහිදි ගරු ඩබ්.ඒ. පුෂ්පජිත් මධුසංඛ අමරසිංහ මන්ත්‍රීතුමා  ප්‍රකාශ කළේ ප්‍රදේශයේ වසම් කිහිපයකම වන අලි ගැටළුව පවතින බැවින් එම කලාපවලට විදි පහන් දැමිම අත්‍යවශ්‍ය බවත් එම ස්ථාන කමිටුවක් මඟින් හදුනාගැනිම සුදුසු බවට යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු ආර්.එම්. ඉන්ද්‍රාවති මන්ත්‍රීතුමිය ස්ථිර කරන ලදි. එලෙසම ගරු  ආර්.එම්. හේමලතා මැණිකේ මන්ත්‍රීතුමය විසින් ප්‍රකාශ කළේ ඇතිමලේ පොදු ක්‍රිඩාංගනය, පොලිසිය හා පුස්තකාලය යන ප්‍රදේශ ඉතා ජනාකිර්ණ බවත්, එම ස්ථාන සඳහා විදි පහන් සවිකර දෙන ලෙසත්ය. ගරු එච්.එම්. මහේෂ් ඉන්දික බණ්ඩාර මන්ත්‍රීතුමා ප්‍රකාශ කලේ ඇතිමලේ කොට්ඨාශයේ රජයේ වී ගබඩාව, MOH කාර්යාලය, ගොවිජන සේවා කාර්යාලය ආශ්‍රිතව දැඩි අඳුරක් පවතින බවත්, ළමුන් හා වැඩිහිටි ජනතාව නිරන්තරව ගැවසෙන බැවින්

විදි පහන් යෙදීම අත්‍යවශ්‍ය බවයි. ගරු උප සභාපතිතුමාමෙහි දි ප්‍රකාශ කලේ ඇතිමලේ ක්‍රීඩාංගනය සම්බන්ධව අපි ස්ථානිය පරීක්ෂණයක් සිදු කළා. එහි තත්වය ඉතා ශෝචනියයි. ඒවා තිප්පොලවල් බවට පත්වෙලා. අපි සියලු දෙනා එකතු වෙලා හොඳ වැඩ සටහනක් සැලසුම් කර එය ක්‍රියාත්මක වන තැනට පත් කරමු.

**සභාව විනාඩි 05කට කල්තබන ලදි. එම යෝජනාව ගරු උප සභාපතිතුමා විසින් සිදු කල අතර ගරු කේ. ආර්. එම්. අමරවංශ මැතිතුමා විසින් ස්ථීර කරන ලදි.** නැවත සභාව ආරම්භ කිරිමෙන් පසුව ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුම් දි සිටියේ සභාව සතුව ප්‍රමාණවත් ලෙස විදි පහන් තොග නොමැති බැවින් සහ සභා අරමුදලට අවහිරයක් නොවන පරිදි නියමිත ප්‍රමිතියෙන් යුතු බල්බ් 500ක්ද LCD ස්විච් 200ක්ද ලබා ගැනිම සුදුසු බවයි. මිළඟට ප්‍රකාශ කර සිටියේ ආයතනය සතු රැස්වීම් ශාලාව විවිධ පාර්ශවයන් වෙත ලබාදිමේ දි ඒ සඳහා අනුමත ගාස්තු අය කිරිමක් සිදු කරන බවයි.
එහෙත් යම් යම් නොවැලැක්විය හැකි අවස්ථාවල රජයේ ආයතනයන්ට මෙම ශාලාව ලබා ගැනිමේ අවස්ථා සිදුවන බවත්, එවැනි අවස්ථාවලදි ගාස්තු ගෙවිමට ඔවුන්ට හැකියාවන් නොමැති අවස්ථාද පවතින බැවින් මේ සඳහා සභාවේ අදහස් විමසන ලදි. එහිදි ගරු බී.බී.සිරිත් ප්‍රියදර්ශන පෙරේරා මැතිතුමා ප්‍රකාශ කර සිටියේ විශේෂ තත්වයන් වලදි මුදල් ලබා ගෙන වෙන් කිරිම සුදුසු බවට යෝජනා කරන ලදි. නොමිලේ ලබා දිමට පදනම වන අය සම්බන්ධව ගරු සභාපති තුමාට බලය පැවරිම සුදුසු බව පවසමින් ගරු කේ.ආර්.එම්. අමරවංශ මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදි . ගරු ටී.ඩබ්. උපාලි වසන්ත කුමාර මැතිතුමා මෙහිදි යෝජනා කර සිටියේ මෙම ශාලාව වෙන් කිරිමේ දි, ජලය ,විදුලිය සේවක පිරිවැයක් වැය වන බැවින් ගාස්තුවක් අය කර දිම සුදුසු බවත් නොවැළක්විය හැකිම හේතුවක් මත ගරු සභාපතිතුමාගේ අනුමැතිය පරිදි නොමිලේ ලබා දිමට සුදුසු බවයි. එම යෝජනාව ගරු වී.ඒ. පුෂ්පජිත් මධුසංඛ අමරසිංහ මන්ත්‍රීතුමා ස්ථිර කල අතර ඔහු තවදුරටත් ප්‍රකාශ කර සිටියේ මෙය පොදු දේපලක් බැවින් සේවාවන් සැපයිමට අප බැදි සිටින අතර ඉහත දක්වා ඇති මුදල් ගෙවිමට නොහැකි රජයේ ආයතනවලටද ආරාක්ෂක අංශයේ අවශ්‍යතා සඳහාද ආගමික කටයුතු වෙනුවෙන්ද නොමිලේ ලබා දිමටත් අනෙකුත් සෑම අවස්තාවකදිම මුදල් අයකර ලබා ගැනීමටත් සුදුසු බවත් එම අදහස ගරු කේ.එම්.වසන්ත රංජිත් කුමාර මැතිතුමා විසින් නැවතත් ස්ථිර කරන ලදි. සභාවේ ඊට එකඟතාවය හිමිවිය. මෙහි පහසුකම් වැඩි දියුණු කිරිමෙන් පසු ගාස්තු සංශෝදනයට යාම සුදුසු බව පවසන ලදි. ඉන්පසු ගරු සභාපතිතුමා විසින් තවත් නිවේදන කිහිපයක් ඉදිරිපත් කරන ලදි.

- ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනත අනුව කොට්ඨාශයේ ප්‍රධාන සෞඛ්‍ය නියාමක බලධාරිය ගරු සභාපතිතුමා බැවින් මහජන සෞඛ්‍ය තහවරු කිරිම සඳහා සෙවාවන් සපය ගනු ලබන මහජන සෞඛ්‍ය පරික්ෂකවරුන් වෙත බලය පැවරිමේ ලිපිය ලබා දියයුතු බවත් , ප්‍රාදේශිය සභා පනත ප්‍රකාරව ස්ථාපිත කර ඇති කාරක සභා සඳහා සාමාජිකයින්ට බලතල පැවරිමේ ලිපි ලබා දියයුතු බවත් ,
- 2026 අයවැය සකස් කිරිම සඳහා අයවැය අවශ්‍ය යෝජනා සලකා බැලිම සඳහා සුදුසු යෝජනා ගරු මන්ත්‍රීවරුන්ට හා මන්ත්‍රීවරියන්ට කඩිනමින් ලබා දිමට කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදි. ආයතනයේ සතු වාහනවල ඉන්ධන භාවිතයන් පිළිබඳ නියාමනයක් සිදු කලයුතු බැවින් ඊට අදාලව සිදු කලයුතු ක්‍රියාවලිය පිළිබඳවත් සභාවේ අදහස් විමසන ලදි. මෙහිදි ගරු කේ.ආර්.එම්. අමරවංශ මැතිතුමා ප්‍රකාශ කර සිටියේ ඉහත කරුණ සම්බන්ධයෙන් එකඟතාවය ලබා දෙන බවත් ය. තවද ඉන්ධන වගේම අනෙකුත් අළුත් වැඩියාවන් පිළිබඳ සොයා බැලිය යුතු බවද පැවසු මැතිතුමා බාහිර පාර්ශවයන්ගෙන් ලැබෙන යම් අදහස් හා යෝජනාද මේ සඳහා සැලකිල්ලට ගතයුතු බවයි. ඒ අනුව නිශ්චිත දිනයකදි සියලු වාහන සඳහා නම් කරනු ලබන සභිකවරුන් හෝ නිලධාරින් ඉදිරිපිට දී ඉන්ධන නිකුත් කළයුතු බවයි. රියදුරන් වාහන භාවිතා කරන විට හා වෙනත් වාහනයක් ධාවනයට යොදවන අවස්ථාවලදි ද වාහනය ධාවනයෙන් අනතුරුව නතර කරන විටද විධිමත්ව භාර දෙන ක්‍රම වේදයක් සකස් කළයුතු බව පවසන ලදි. වාහනවල පවතින අඩුපාඩු පිළිබඳවත් වත්මන් තත්වය එම වාහන සඳහා ලබාදෙන ඉන්ධනවල භාවිතයන් හා ගිය වියදම පිළිබඳ තත්ව වාර්තාවක් සභා ගත කිරිම සුදුසු බව ගරු කේ.එම්.වසන්ත රංජිත් කුමාර මැතිතුමා විසින් යොජනා කරන ලදි. ගරු සභාපතිතුමා විසින් නම් කරන ලද කෙනෙක් ඉන්ධන අධික්ෂණය සඳහා යෙදවිම සුදුසු බවට සභාව තිරණය කරන ලදි. නිලධාරින් ඉදිරියේදි කෝප් කමිටුවට යොමු නොවිමට අප සියලු දෙනා වගබලා ගතයුතු බවද සභාපතිවරයා පවසන ලදි. මෙහිදි ගරු ටී.ඩබ්. උපාලි වසන්ත කුමාර මැතිතුමා විමසා සිටියේ මහජන සෞඛ්‍ය පරික්ෂකවරුන්ට සහ සුනඛ එන්නත්කරුවන්ට ලබාදෙන ඉන්ධන පිළිබඳ නියාමනයක් සිදු කිරිම අවශ්‍ය බවයි. එය පරිසර කමිටුවට යොමු කරන ලදි.

- ගරු එච්.එම්. මහේෂ් ඉන්දික බණ්ඩාර මැතිතුමා ඉල්ලා සිටියේ අප විසින් ඉන්ධන ලබාදෙන වාහන සම්බන්ධ වාර්තාවක් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලෙස පවසන ලදි.

**<u>සංදේශ සහ පෙත්සම්.</u>**

01. සියඹලාණ්ඩුව පොල අසල ඉඩම් කොටසක් විසිතුරු මල් පැල තබා අලෙවි කිරිමේ කටයුතු සඳහා වෙන්කර දෙන ලෙස අංක 300, 5 වන ගම්මානය පදිංචි රවි උදේනි සමරකෝන් යන අය විසින් කරන ලද ඉල්ලීම සභාගත කරන ලදි. ඒ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය හිමිවිය. මෙහිදි ගරු ආර්.එම්. ඉන්ද්‍රාවති මැතිණිය පැවසුවේ මෙය ඉතා හොඳ වැඩසටහනක් බවත් එවැනි අය එකතු කර ගෙන ඉදිරියේදි හොඳ වැඩසටහනක් කරමු යන්නය.

02. 124 පැරකුම්පුර ගමගල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරිම සඳහා එච්.එම්.ධනුෂ්ක පද්ම කුමාර විසින් කර තිබු ඉල්ලිම PSDG වැඩසටහන යටතේ ඉදිරියේදි යොමු කිරිමට සභාවේ එකඟතාවය හිමිවිය.

03. මයුරාගම කිවුල්ගේ අමුණ මයුරාගම මාර්ගය පිළිසකර කරදෙන ලෙස Y සුමනාවති මහත්මිය කර තිබු ඉල්ලිම් ඉදිරි සංවර්ධන යෝජනාව සඳහා යොමු කිරිමට සභාවේ එකඟතාවය හිමිවිය.

04. මුතුකණ්ඩිය 2 ගම්මානය පිහිටි ක්‍රීඩා පිටිය සහිත ඉඩමේ ජලය බැස යාම සඳහා කාණුවක් කපා දෙන ලෙස ඩී.එම්. මුදලිහාමි මයා විසින් කරන ලද ඉල්ලීම සභාගත කරන ලදි. ඒ පිළිබඳව කාර්මික සේවා කාරක සභාවට යොමු කර එමගින් ලැබෙන නිර්දේශ මත සකස්කර දිම සුදුසු බවට එකඟතාවය හිමි විය.

05. මහකළුගොල්ල ප්‍රදේශයේ වන අලින්ගේ පහර දිමෙන් තම ස්වාමියා මියගොස් ඊ.චමිලා ක්‍රිශාන්ති මහත්මිය වැසිකළි ආධාර සඳහා සිමෙන්ති කොට්ට 10 ඉල්ලා තිබුණි. මේ සඳහා වසමේ ග්‍රාම නිලධාරි නිර්දේශය හිමිව තිබි බැවින් ගරු ආණ්ඩුකාරතුමාගේ නිර්දේශ ලබාගෙන මෙම සිමෙන්ති කොට්ට ලබාදිම සුදුසු බවට සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

06. නුගගහකිවුල දයාරත්න ස්ටෝර්ස් අසල මාර්ගය සැකසිමට කර තිබූ ඉල්ලිම සභාගත කරන ලදි. එම යෝජනාව ඉදිරි සංවර්ධන යෝජනා සඳහා යොමු කර ඒ අනුව ඉදිරි කටයුතු කිරිමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

- **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත**
- **යථා පරිදි කල් දී ඇති යෝජනා -**

මෙහිදි ගරු සභාපතිතුමාහට අත්‍යවශ්‍ය රාජකාරි රැස්විම් කටයුත්තක් සඳහා කැඳවිමක් ලැබි ඇති බැවින් මුලාසනය ගරු උපසභාපතිතුමා වෙත භාර දී සභාවෙන් නික්ම යන ලදි.

**ගරු ඩබ්.ඒ. පුෂ්පජිත් මධුසංඛ අමරසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා -**
01. කොටියාගල ප්‍රදේශයේ මාර්ග කිහිපයක් ප්‍රතිසංස්කරණය කිරිමට ඒකමතිකව අනුමැතිය හිමිවිය.
02. විදි ලාම්පු සකස් කර ගැනිම - මේ සම්බන්ධව මිට පෙර සාකච්ජා කර ලබා දුන් තිරණය පරිදි කටයුතු කිරිම සුදුසු බවට තිරණය කරන ලදි.
03. කොටියාගල සති පොළ නැවත ආරම්භ කිරිම .- මේ පිළිබඳව පැහැදිලි කිරිමක් කර දෙන ලෙස ගරු උප සභාපතිතුමා විසින් ගරු වී.ඒ.පී.මධුශංක අමරසිංහ මන්ත්‍රීතුමාට පවසන ලදි. ගරු මන්ත්‍රීතුමා පැවසුවේ කොටියාගල පැවැති මහජන පොළ කාලයක් පැවැති අතර, මේ වන විට එය වැසි ගොස් තිබෙනවා. අනෙකුත් මහජන පොළවල්වලට භාණ්ඩ සැපයිමේදි විශාල වියදමක් දැරිමට සිදුවනවා. එලෙසම ප්‍රදේශයේ ජනගහනය වර්ධනය වී තිබෙනවා. එබැවින් ඉතාම අවම පිරිවැයක් දරා පහසුවෙන් ද්‍රව්‍ය රැගෙනවිත් අලෙවි කිරිමට හැකිවන පරිදි කොටියාගල මහජන පොළ නැවත ආරම්භ කිරිම සිදු

කර දෙන ලෙස ඉල්ලා සිටිනවා. මේ සඳහා ආයතනයේ ප්‍රතිපාදන හා වාහන පහසුකම් මෙම අවස්ථාවේදී ප්‍රමාණවත්ව යොදවා ගැනීමට නොහැකි වන්නේ නම්, ඉදිරියේදී විධිමත්ව සකස්කර දෙන තෙක් පෞද්ගලිකව හෝ මැදිහත්වී මෙය සංවර්ධනය කිරීමට මා අපේක්ෂා කරනවා. ඉදිරි වර්ෂයේ අයවැයෙන් මේ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. ඒ සඳහා නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවෙන් පූර්ණ වාර්තාවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා .

ගරු කේ.ආර්.එම් අමරවංශ මැතිතුමා විසින් යොමු කර තිබූ කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලෙසත් කාලවේලාව ඉක්ම ගිය බැවින් තමන්ගේ අදහස් දැක්වීමේ අවස්තාව කෙටියෙන් ඉදිරිපත් කරන ලෙසත් ගරු උපසභාපතිතුමා විසින් දැනුම් දීම අනුව මන්ත්‍රීවරයා මෙසේ ප්‍රකාශ කරන ලදී.

I. කොටියාගල පාරාම්පරික ඉඩම් මේ වන විට වනවගා රක්ෂිතවලට වෙන් කර ජනතාවගේ පරිහරණයෙන් ඉවත් කර තිබීම මත කාලාන්තරයක් හේන් ගොවිතැනින් ජීවත් වූ ජනතාවට විශාල අසාධාරණයක් සිදු වී තිබෙනවා. සියඹලාණ්ඩුව කලාපයම දියුණු තැනකට ගෙන ඒමට මේ හේන් ගොවිතැන හේතු වූ බවද මා සඳහන් කරනවා. 2020 වර්ෂයේ යම් බිම් ප්‍රමාණයක් තහනම් කළත් එය ප්‍රමාණයෙන් අක්කර 60000 ත් 90000 ත් අතර වන බව මාගේ විශ්වාසයි. මේ ගැටළුව සඳහා නිශ්චිත විසඳුම ලබා දීමට අප සභාවට හැකි දෙයක් නොවේ. අප බල ප්‍රදේශයට අයත් ඉඩම් සඳහා මෙම ගැටළුව ඇතිවීම හේතුවෙන් පළමු හඩ නැගීම කොට්ඨාශයේ ප්‍රධානම අප ආයතනයෙන් ඉදිරිපත් කිරීම වටිනවා. මම ඉදිරිපත් කරන මෙම යෝජනාව සභා සම්මත කර ප්‍රදේශීය ලේකම් හරහා ප්‍රදේශීය සම්බන්ධිකරණ කමිටුවට යොමු කරමු. ඉන් අනතුරුව දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුවට යොමු කර ඔවුන් මඟින් අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කිරීම සුදුසුය. මෙලෙස පීඩාවට පත් ජනතාව වෙනුවෙන් පක්ෂ පාට භේදයකින් තොරව අප සියලු දෙනා පෙනී සිටින බව දැක්වීම අපගේ පූරුණ අරමුණ බව මා දන්වා සිටිනවා.

II. ඊළඟ යෝජනාව වශයෙන් කාර්ය මණ්ඩලයේ සුභසාධන සඳහා අප මැදිහත් වීම අපගේ වගකීමකි. දැනටමත් එම අය විසින් වෙනම සුභ සාධන වැඩ පිළිවෙළක් සකස් කර අවශ්‍යතා සපුරා ගන්නවා. මෙම කාර්ය මණ්ඩලය කාර්යක්ෂමතාවය වෙනුවෙන් මානව සම්පත් කළමනාකරණය ඉහල මට්ටමකින් සිදු කිරීම සඳහා ද නියාමනය සඳහාද අපගේ මැදිහත් වීම සුදුසු බව යෝජනා කරනවා.

<u>ගරු ආර්.එම්.අබේපාල මැතිතුමා.</u>

ගරු කේ.ආර්.එම්. අමරවංශ මැතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනා දෙනා ඉතා කාලෝචිත යෝජනා දෙකක් බැවින් මම එම යෝජනා ස්ථිර කර සිටිනවා. එලෙසම ඒ සඳහා මම ගෞරව කරනවා. සභාවේ පක්ෂ පාට වලින් තොරව නිවැරදි අරමුණු වලින් කටයුතු කිරීම අප අගය කරනවා. ඉඩම් ගැටළුව දෙස බැලුවොත් මීට මැදිහත් වූ ඉහල පාර්ශවය නිවැරදි ක්‍රමවේද අනුගමනය නොකර ඔවුන්ගේ අවශ්‍යතාවය ඉටු කර ගැනීම වෙනුවෙන් තීරණ ගෙන ක්‍රියාත්මක වී තිබෙනවා. අප මේ වෙනුවෙන් පසුගිය කාලය පුරාවට ජනතාව සමඟ පෙනී සිටියා. බොහෝ පිරිසක් පරිසර යුක්ති කේන්ද්‍රය ලබාදෙන අදහස් අනුගමනය කලා. අපේ සභාවේ ආර්ථිකය දියුණුවට මෙම ගොවි පිරිස සෘජුවම මැදිහත් වෙනවා. හිටපු දිසාපතිතුමිය ඉතා මැනවින් මේ පිළිබඳ අවබෝධ කරගෙන තීරණ ගත්තා. එහෙත් දේශපාලන නායකයින් සියල්ලම එවකට උපක්‍රමශීලි වුනා. එහෙත් ප්‍රායෝගික වුනේ නැහැ. මේ ගැටළුවට අදාලව වැඩිම දෝෂාරෝපණයට ලක්වුනේ මමයි. සාධාරණ විකල්ප විසඳුම් අදටත් ලබාදී නෑ. මෙම තත්වය හෙට ඉපදෙන දරුවන්ටත් බලපාන තත්වයකී. කොට්ඨාශයේ ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් සභාව ගන්නා ඕනෑම තීරණයකට මම එකඟයි. මේ වෙල්ලස්සේ පුරවැසියන් වෙනුවෙන් අප එකට සිට හඩ නගමු. ඇතිමලේ සීනි සමාගම දැනට තිබෙන තත්වයද ඉතා කණගාටුයි. මම තමයි මීට මුලින්ම විරුද්ධ වුනේ. කතාවක් තියෙනවා සීනි කැවේ අන්දරේ කියලා. ඒ වුනාට අපේ ගොවියා කැවේ පස්. උක්ගස් සඳහා බදු ගෙවන්නෙක් අපේ ගොවියන් උක් ගොවියන් ආරක්ෂා කිරීමට අපි මැදිහත් වෙමු. අවස්ථා 5කදී මම බලයට පත්වුනා. වියයුතු දේ නිවැරදිව සිදුවනවා නම් අපි උපරිම සහයෝගය දෙනවා. ඒ අනුව ගරු කේ.ආර්.එම්. අමරවංශ මැතිතුමා දුන් යෝජනා දෙක නැවතත් මම ස්ථිර කරන අතර සභාවේ සියලු දෙනාගේ ඒකමතික එකඟතාවය අපි ලබා දෙනවා .

**ගරු එල්.එල්. සුජිත් කුමාර මැතිතුමා**

අපි ගොවියොත් සමඟ එක්ව උද්ඝෝෂණය කලා. පක්ෂ විපක්ෂ අප සියලු දෙනා මෙම යෝජනා දෙකට එකඟයි. මොනරාගල ඉතා වටිනා කුඹුක්කන් ඔය වාරි ජල යෝජනා ක්‍රමය මඟින් මෙම වගා බිම් ඉතාමත් හොඳින් සශ්‍රීක කල හැකියි. ඒ නිසා මෙම වාරි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය මැදිහත් වීම සිදු කරන ලෙස ඉල්ලනවා. මෙම ස්වර්ණමය අවස්ථාවක් බැවින් එයින් උපරිම ප්‍රයෝජන ගැනිමට වගබලා ගන්නවා .

**ගරු කේ.එම් වසන්ත රංජිත් කුමාර මැතිතුමා**

කොටියාගල ඉඩම් අහිමි ගොවින්ගෙන් එලෙස පවරා ගත් ඉඩම් සම්බන්ධයෙන් පාර්ශවයන් කිහිපයක් මඟින් ක්‍රියාත්මක නඩු රාශියක් දැනට තියෙනවා. ඒ අයගේ ක්‍රියාත්මක නඩු කටයුතු සඳහාද මෙම සභා තිරණය ඉතා වැදගත් වේවි. මෙහිදි සභාව කාරක සභාවක් බවට පත් කර මෙහි තියෙන නිතිමය තත්වය පිළිබඳ සභා සභාලේකම්ගෙන් විමසිමක් කරන ලදි . එහිදි සභා ලේකම්වරයා ඒ පිළිබඳ පැහැදිලි කිරිමක් සිදු කරන ලදි. නැවත සභාව කටයුතු ආරම්භ කල ගරු උප සභාපතිවරයා ගරු කේ.ආර්.එම් අමරවංශ මැතිතුමාගේ දෙවන යෝජනාව මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාවට යොමු කර වාර්තාවක් ලබාගෙන තිරණයක් ගනිමු, යැයි ප්‍රකාශ කරන ලදි. මිළඟට ගරු උපසභාපතිවරයා යෝජනා කර සිටියේ ප්‍රාදේශීය සභාවට අයත් ඇතිමලේ පොලීසිය ඉදිරිපිට ඇති කඩකාමර අතරින් අංක 01 කඩකාමරය බදු ගෙන ඇති බදු කරුවන් ඉදිරිපත් කර ඇති ලිපියකින් දක්වා ඇත්තේ කඩකුලී ගෙවිමට අපහසු බවත් දඩ මුදල් ගෙවිමට නොහැකි බවත් එම දඩ මුදල් කපා හරින ලෙසත් ඊට ප්‍රධාන හේතුව වි ඇත්තේ ගොඩනැගිල්ලේ අබලන් තත්වය හා වැසි දිනවල කාමර ඇතළත තෙමෙන බවයි. මෙහිදී ගරු කේ.ආර්.එම් අමරවංශ මැතිතුමා ප්‍රකාශ කලේ ඔහුගේ පුද්ගලික අදහස වන්නේ මෙම කඩකාමර ලබා ගන්නා විට හා කාලිනව ගිවිසුම් ගතවන විට මේ සියලු තත්වයන් දැනගෙන සිටින බවත් එසේ තිබියදිම ඔවුන්ට වෙළදාමෙන් පාඩු සිදුවනවිට ගිවිසුම් කොන්දේසි උපයෝගිකර ගෙන හෝ අනුකම්පා සහගත ලිපි ඉදිරිපත් කරමින් හෝ සහන ඉල්ලන බවයි. මෙහිදි කිසිම අනවශ්‍ය බුරුලක් ලබා නොදිය යුතු බව ප්‍රකාශ කරන ලදි. ගරු ටී.ඩබ්. උපාලි වසන්ත කුමාර මැතිතුමා ප්‍රකාශ කර සිටියේ මෙම කඩ සම්බන්ධයෙන් ඇප තැන්පත් මුදල් තබාගෙන නොමැතිද යන්නයි. ගරු බි.බි. සිරිත් ප්‍රියදර්ශන මැතිතුමා ප්‍රකාශ කලේ, තමා මෙම තත්වය පිළිබඳ දන්වා ඇති බවත් ,ගිවිසුම් කොන්දේසි අනුව කටයුතු කර ඔවුන්ට අත්‍යවශ්‍ය කටයුතු හෝ කරදිමට හැකිනම් ඒ සඳහා මැදිහත් විම සුදුසු බවයි. හේතුව නම්, ඔවුන් අපට බදු ගෙවිමට යටත් පිරිසක් විමත් එම දේපල සභාව සතු විමත් බවයි. තවද ගරු සිරිත් ප්‍රියදර්ශන මන්ත්‍රීතුමා විමසා සිටියේ වෙළදුන් නිසි පරිදි බදු ගෙවන බවත් ආයතනයෙන් නඩත්තු කටයුතු නොකරන බව වෙළදුන් පවසන බවයි. කිසිම කඩයක් අතුරු බදු දිම සිදු නොකළ යුතුයි. ගිවිසුම් ගතවී ඇත්තේ බදු කරු නම් ඔහු ව්‍යාපාරය කළ යුතුයි. දැනට පරික්ෂාවන් කර අතුරු බදු දි තිබෙනම් ඒ පිළිබඳ විස්තර ලබා ගෙන ඉදිරිපත් කරන ලෙස ඉල්ලන ලදි. එමෙන්ම ගරු එල්. එච්. හර්ෂණි මධුමාලි මැතිතුමිය ප්‍රකාශ කර සිටියේ ඇතිමලේ කඩකාමර බහුතරයක් පවත්වාගෙන යනු ලබන්නේ කාන්තාවන් බවත්, ඔවුන්ගේ කුලිය ලෙස රු7500.00 බැගින් ලබා ගන්නා බවත් , ඒ අනුව එම අයට සනිපාරක්ෂක පහසුකම් සලසා දිම සිදු කර දෙන ලෙසයි. ගරු ආර්.එම්. හේමලතා මැණිකේ මැතිතුමිය ප්‍රකාශ කලේ ඇතිමලේ කඩකාමර පවත්වාගෙන යන්නේ දුෂ්කරතා රාශියක් මතයි. ඒ අනුව යම් පමණකින් හෝ බදු මුදල අඩු කිරිමට ඒ සඳහා මැදිහත්ව කටයුතු කිරිම සුදුසු බව පවසන ලදි. එලෙසම ගරු එල්.එල්. සුජිත් කුමාර මැතිතුමා ප්‍රකාශ කලේ එම දොඹගහවෙල කඩකාමර වල තැන්පතු මුදල් ආයතනය සතුව තිබේද එසේ තිබේ නම් ඊට අදාලව ගන්නා ක්‍රියාමාර්ග මොනවාද යන්න හඳුනා ගත යුතු බවයි. ගරු කේ.එම් වසන්ත රංජිත් මැතිතුමා විමසා සිටියේ දොඹගහවෙල ප්‍රදේශයේ සභාව විසින් බදු අයකරන ලද කඩකාමර පසුගිය කාලයේ කඩා ඉවත් කර ඇති බවත් ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරිම සුදුසු බවත්ය. ඒ අනුව ගරු උප සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ අපට මේ පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවක් ලබා ගැනීම සුදුසු වෙනවා. වර්තමාන තත්වය පරික්ෂා කිරිමට කාර්මික කටයුතු පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරමු. මහ සභාවට පෙර මෙම වාර්තාව අපි ලබා ගනිමු. යනුවෙනි.

ගරු උප සභාපතිවරයා නැවත අදහස් දක්වමින් දන්වා සිටියේ වැඩ පාරිපාලකවරයා විසින් ලිපියක් ඉදිරිපත් කර ඇති බවත් එහි දක්වා ඇත්තේ සභා රැස්විම් ශාලාවට උපකරණ ලබා ගැනිමට අවශ්‍ය බවත්

එහි පහසුකම් වැඩි දියුණු කළයුතු බවත්ය. එහිදි තිරණය කරන ලද්දේ සභා අරමුදලේ ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන ඇති අවස්ථාවක ප්‍රමුඛතාවය පදනම් කර ගනිමින් අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනිම සුදුසු බවයි. ඉන් අනතුරුව ගරු උප සභාපතිතුමා විසින් රිටිගහවත්ත පාසල අසල සිට මල්මණ්ඩිය දක්වා මාර්ගය පිළිසකර කර දෙන ලෙස ගම්වාසීන් විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී. සභා අනුමැතිය යටතේ සුදුසු තැනකට යොමු කරමින් සිදු කිරිමට තීරණය කරමු යනුවෙන් ප්‍රකාශ කරන ලදී. තවද ගොඩමුල්ල ගල්ගේකොටුව මාර්ගය පිළිසකර කර දෙන ලෙස ගම්වාසින් විසින් කරන ලද ඉල්ලීම ගරු සභාවට ගරු උප සභාපතිතුමා විසින් ලිපියක් ඉදිරිපත් කරන ලදී. සභා අනුමැතිය මත ඉදිරියේදී ප්‍රාදේශිය සම්බන්ධිකරණ කමිටුවට ඉදිරිපත් කර අවශ්‍ය ඉදිරි කටයුතු කරමු යනුවෙන් ගරු උප සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මිළහට කාරක සභා තුලින් ඉදිරිපත් කර ඇති යෝජනා ගරු උපසභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

2025.06.17 වන දින පැවැති මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාවේදි සාකච්ඡා කල කරුණු මහ සභාවට ඉදිරිපත් කිරිම සඳහා පැවති මුදල් හා ප්‍රතිපත්ති පිළිබද කාරක සභාවේ දී සාකච්ජාවට බඳුන්කරන ලද පහත සඳහන් යොජනා හා අදහස් මහසභාවට දැනගැනීම සඳහා පහත සඳහන් කර ඉදිරිපත් කරමි.

01. ප්‍රාදේශීය සභාව විසින් අත්‍යාවශ්‍යයෙන්ම ගෙවීමට බැදී සිටින ගෙවීම් (ව්‍යවස්ථාපිත ගෙවීම්) කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බවත් එවැනි ගෙවීම් ඍජුවම ගරු සභාපති තුමා වෙත යොමු කර අවශ්‍ය වියදම් දැරීම සුදුසු බව තීරණය කරන ලදී.

02. මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන්ගේ ගමන් වියදම් ගෙවීම අනුමක කරන ලදී.(මාසික ඉටුකළ වැඩ වාර්තාවක් ලබාගත යුතුය)

03. වීථි ලාම්පු ලබාගැනීමේදි ප්‍රසම්පාදන කමිටුවක් පිහිටුවා ඒ හරහා මිලදී ගැනිම සුදුසු බව තිරණය කරන ලදී.

04. ප්‍රදේශයේ නළ ළිං අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී එම නළ ළිං පිළිබඳ වාර්තාවක් ලබාගෙන ඒ සම්බන්ධව කටයුතු කිරීමට තීරණය කරන ලදී.

05. සභාවට අයත් ජායාපිටපත් යන්ත්‍ර පරිහරණ කිරීමේදී විධිමත්ව ලේඛන වල සටහන් තබාගනිමින් භාවිතා කිරීම සුදුසු බව තීරණය කරන ලදී.

06. කාර්යාලයට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය හා අනෙකුත් ද්‍රව්‍ය මිලදී ගැනීමේදී අවම මිල ගණන් ඉදිරිපත් කරන ප්‍රාදේශීය වෙළඳ ප්‍රජාවට ප්‍රමුඛතාවයක් ලබාදීම සුදුසු බව තීරණය කරන ලදී.

07. ආයතනයේ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය හා බැකෝ ලෝඩර් යන්ත්‍රය සම්බන්ධව පවතින දෝෂ හා අළුත්වැඩියාවන් පිළිබඳව ඉදිරිපත් කර තිබූ ලිපි සම්බන්ධයෙන් සාකච්චා කිරීමේදී මෙම යන්ත්‍ර අළුත්වැඩියා කිරීම සඳහා විශාල වියදමක් දැරීමට සිදුවන බවත්,ඊට සාපේක්ෂව ආයතනයේ මූල්‍ය තත්වයද දූර්වල මට්මටක පවතින බැවින් හා මෙම වාහන වල පසුගිය කාලයේ විශාල පිරිවැයක් දරා අළුත් වැඩියා කටයුතු සිදු කළත් ඊට සාපේක්ෂව ආදායම් ඉපයීම නොහැකි වීමත් යන හේතු නිසා මෙම වාහන පිළිබඳ පූර්ණ වාර්තාවක් ලබා ගැනීමේන පසුව ලබාදෙන නිරීක්ෂණ මත ඉදිරි කටයුතු කිරීමට පියවර ගැනීම සුදුසු බව තීරණය කරන ලදී.

08. UPRB 4995 දරණ ට්‍රැක්ටර් රථය ටයර් දෙකක් ලබාගැනීම සඳහා ලිපියක් ඉදිරිපත් කර තිබූ අතර එම ටයර් විධිමත් ලෙස ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් සෑම වාහනයකම වගකීම ලිඛිතව පවරා දියයුතු බවත් තීරණය කරන ලදී.

09. ආයතනය සතු ට්‍රැක්ටර් රථ හා අනෙකුත් වාහන නියමිත දුර හෝ නියමිත පැය ගණන සම්පූරණ වී තිබේනම් ඒවා සේවා කරගැනීමේ කටයුතු නියමිත වේලාවට සිදුකරගැනීම සුදුසු බව තීරණය කරන ලදී.

10. දැනට සභාව සතුව පවතින කොම්පෝස්ට් තොගය,ආදර්ශ ගොවිපලවල් හඳුනාගෙන ඒවාට සහන මිලක් යටතේ ලබා දීම සුදුසු බව සාකච්චා කළ අතරම එම පොහොර තොගය අලවි කිරීම සඳහා සුජිත් කුමාර මන්ත්‍රී තුමාට මැදිහත්ව කටයුතු කරන ලෙස දැනුවත් කරන ලදී.

11. සභාවට අයත් ක්‍රීඩාපිටි වල උත්සව පැවැත්වීමේදී එම විනෝද බද්ද අයකිරීමේදී නියමිත පරිදි අයකිරීමට කටයුතු කරන ලෙසත්,උත්සවයක් පැවැත්වෙන අවස්ථාවන් වලදී ගරු මන්ත්‍රීවරයෙකුට එම ස්ථානයට ගොස් පරික්ෂා කර බැලීම සුදුසු බව තීරණය කරන ලදි.

මේ සම්බන්ධව මොනාහරි ගැටලු තියනවාද යන්න ගරු උපසභාපතිතුමා විසින් සභාවෙන් විමසීමක් කරන ලදි.

**2025.06.17 වන දින පැවැති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවේදි සාකච්ඡා කළ කරුණු මහ සභාවට ඉදිරිපත් කිරිම සඳහා**

- සියඹලාණ්ඩුව සති පොළ ආසන්නයේ ප්‍රධාන මාර්ගයට මුහුණලා කඩකාමර කිහිපයක් ඉදිකිරිම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කිරිම.
- පහතඅරාව ප්‍රදේශයේ සති පොළක් ස්ථාපිත කිරිම.
- කොට්ඨාශය තුල සිටින අඩු ආදායම්ලාභින්ගේ තොරතුරු ඇතුළත් නාම ලේඛනයක් ලබා ගැනිම.
- කොට්ඨාශය තුල සිටින ආබාධිත පුද්ගලයින්ගේ නාම ලේඛනයක් ලබා ගැනිම.
- ස්වයං රැකියා ආරම්භ කිරිම සඳහා වැඩ මුළු සංවිධානය කිරිම.
- කොට්ඨාශය තුල සංස්කෘතික වැඩ සටහන් සංවිධානය කිරිම.
- පහතආරාව පාසලේ ඇති අබලන්වූ ගොඩනැගිල්ල අලුත් වැඩියා කිරිම සඳහා මැදිහත් විම.
- වැලි තොටුපොළක් ආරම්භ කිරිම.
- බේකරියක් ආරම්භ කිරිම.
- සියඹලාණ්ඩුව නගරය තුල ප්‍රාදේශිය සභාව මඟින් පාලනය වන ආදර්ශ පෙර පාසලක් ඉදිකිරිම.
- පාසල් නොයන දරුවන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම.

මේ සම්බන්ධව මොනාහරි විරෝධතා තියනවාද යන්න ගරු උපසභාපතිතුමා විසින් සභාවේන් විමසීමක් කරන ලදි.

**2025.06.18 වන දින පැවැති පරිසර හා පහසුකම් පිළිබඳ කාරක සභාවේදි සාකච්ඡා කළ කරුණු මහ සභාවේ ඉදිරිපත් කිරිම සඳහා**

- ❖ සියඹලාණ්ඩුව බල ප්‍රදේශයේ ජනතාවට අත්‍යවශ්‍ය සේවාවක් වන ගලිබවුසර් සේවාව ප්‍රාදේශිය සභාව හරහා සැපයිම සඳහා ගලිබවුසරයක් ලබා ගැනිමට සාකච්ඡා කිරිම.
- ❖ සුනඛයන් එන්නත් කිරිමේ කටයුතු, ජලභීතිකා රෝග මර්ධන කටයුතු සිදුකිරිම හා අයාලයේ යන බල්ලන් වඳ කිරිම සඳහා කටයුතු සිදුකිරිම

- පෙර පාසල්  හා පාසල් ළමුන් කසළ කලමණාකරනය පිළිබඳව දැනුවත් කිරිමේ කටයුතු සිදුකිරිම හා ළමුන් සඳහා රචනා තරඟ, චිත්‍ර තරඟ, පවත්වා තෑගි ලබා දීම මගින් ළමුන් දිරිමත් කිරිමේ වැඩසටහන් සිදුකිරිම
- ව්‍යවසායකයින් සවිබල ගැනිවීම සඳහා වැඩසටහන්  ක්‍රියාත්මක කිරිම හා ව්‍යවසායකයින්ගේ භාණ්ඩ විකුණා  ගැනිමට සියඹලාණ්ඩුව පොල භූමියේ ප්‍රධාන පාරට මුහුණලා කඩකාමර සෑදිමට යෝජනා විය.
- අම්පාර හන්දියේ සනිපාරක්ෂක පහසුකම් සහිත  ගොඩනැගිල්ලක් සෑදීමට යෝජනා විය.
- වසමේ ග්‍රාමනිලධාරි හා වසම්භාර නිලධාරින් දැනුවත් කිරිම්  සිදුකර ඩෙංගු බෝවන ස්ථාන පිරිසිදු කිරිමේ වැඩසටහන් සංවිධානය කිරිම.
- ඇතිමලේ නගරයේ සිට සේනානායක හන්දිය තෙක්  කුණු ප්‍රවාහනය කරන ට්‍රැක්ටරය ගමන්ගත යුතු බවත් එහිදි ඇතිමලේ ජාතික පාසලේ හා ඇතිමලේ ප්‍රාථමික විදුහලේ කුණු ලබා ගැනිමටද කටයුතු           සිදු කිරිම
- දොඹගහවෙල නගරයේ සිට ලියන්ගොල්ල හන්දි තෙක් කුනු ප්‍රවාහන ට්‍රැක්ටරය කසල ලබා ගැනිම සඳහා ගමන් කිරිම සිදු කිරිම
- පාසල් වලට කසල බඳුන් ලබා දිමට යෝජනා කිරිම
- සභාව සතු දේපල හෝ සතිපොලවල ඇති කඩකාමර අතුරු බදු දිම් සිදුකර ඇත්නම් ඒ පිළිබඳ සොයා බැලීමට කටයුතු සිදුකිරිම
- ආපදා තත්වයන් වලදි ගස්කඩා වැටිම් වැනි අවස්ථාවලදි චෙන්සෝ යන්ත්‍රයක් ගස් කපා ඉවත් කිරිමට අවශ්‍ය වන බැවින් දොඹගහවෙල උප  කාර්යාලයට හා සියඹලාණ්ඩුව ප්‍රාදේශිය සභා ප්‍රධාන කාර්යාලයට යන්ත්‍ර දෙකක් ලබා ගැනිමට කටයුතු සිදුකිරිම
- වෙළඳපොලවල් වල ඇති භාණ්ඩවල මිල ගණන් මහජනතාවවට ප්‍රදර්ශනය වන ආකාරයට මිල දර්ශකයක් ප්‍රදර්ශනය  කිරිම
- දොඹගහවෙල සිල්ලර  පොල භූමියට ප්‍රවේශවන  ස්ථානයේ  ප්‍රධාන පාරට මුහුණලාඇති කඩකාමර දැනට අබලන් තත්වයේ පවතින  බවත් එම කඩකාමර පිළිසකර කර වෙළඳුන් වෙත ලබා දීමට කටයුතු සිදුකිරිම
- දොඹගහවෙල ලංකා බැංකුව අසල ගිමන්හලක් සෑදිමට කටයුතු සිදුකිරිම
- සියඹලාණ්ඩුව බල ප්‍රදේශයේ ඇති සුසාන භූමි මැන ප්‍රාදේශිය සභාවට පවරා ගැනීම සඳහා ප්‍රාදේශිය ලේකම්තුමා දැනුවත් කිරිමේ කටයුතු සිදු කිරිම
- නිවාසවල එකතුවන කසල යොදාගනිමින් බයෝ ගෑස් නිපදවීම සඳහා මහජනතාව දැනුවත් කිරිමේ වැඩසටහන් ක්‍රියාත්මක විම

මේ සම්බන්ධව මොනාහරි විරෝධතා  තියනවාද යන්න ගරු උපසභාපතිතුමා විසින් සභාවෙන් විමසිමක් කරන ලදි. ඉන් අනතුරුව ගරු උප සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ න්‍යායපත්‍රානුකූලව ඊ ළඟට ඇත්තේ ආදායම් වියදම් වාර්තාව ඉදිරිපත් කිරීමටයි. මෙම සභාවාරය ආරම්භ කිරිම 2025.06.13 දින ආරම්භ කල බවත් මාසය අවසන්විමට තව ඉදිරියට දින ඇති බැවින් එම කාලයට අදාල ආදායම් වියදම් වාර්තාව ඊළඟ මාසයේදි ඉදිරිපත් කිරිමට පියවර ගන්නා බවයි. අනතුරුව ගරු උප සභාපති ප්‍රකාශ කර සිටියේ මේ අවස්ථාව උදා වි ඇත්තේ විශේෂ නිවේදන ඉදිරිපත් කිරිමේ අවස්ථාවයි. කාලය ඉක්ම ගොස් ඇති බැවින් මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීම ඉතා කෙටියෙන් ඉදිරිපත් කරන ලෙසයි.

ගරු එල්.එල්. සුජිත් කුමාර මන්ත්‍රිතුමා නැවත කරුණු ඉදිරිපත් කරමින් මොහු පවසා සිටියේ ඉදිගස්ඇල්ල කරාන මාර්ගයේ අනතුරුදායක මාර ගහක් පවතින බවත් එය හැකි ඉක්මනින් කඩා ඉවත් කර අනතරු තත්වය වළක්වා ගැනිමට කටයුතු කළයුතු බවයි. ඒ පිළිබඳ ඔබතුමාට ලිඛිතව දැන්වීමට හැකි නම් ඉදිරිපත් කරන්න. එවිට ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට පහසු වන බව ගරු උප සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. ගරු බි.බි සිරිත් ප්‍රියදර්ශන මන්ත්‍රීතුමා  ප්‍රකාශ කලේ ඇතිමලේ කලුඔබ්බ කොන්ක්‍රීට්

මාර්ගය යම් යම් තැන්වල පළුදු වී ඇති බවත්, එම ස්ථාන වල කම්බි මතු වී ඇති බැවින් අනතුරු සිදු විමට ඉඩ ඇති නිසා එය යථා පරිදි සකස් කිරිමට අදාල පාර්ශවයන් දැනුවත් කරන ලෙසයි. මෙහිදි ගරු උප සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ මේ පිළිබඳ ලිඛිතව දන්වන්නේ නම් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවයි.

ගරු කේ .එම් .ධර්මදාස බණ්ඩාර මැතිතුමා

අද දවස හරිම පුදුම සුන්දර දවසක්. ඊට හේතුව නම් අද කවුරු හෝ පිටස්තරයෙක් මෙම ස්ථානයට පැමිණ සිටියානම් ඔවුන් සියලු දෙනා සිතාවී අප සියලු දෙනා එක පක්ෂයක බවත් පොදු සමුහිකත්වය ආරක්ෂා කර ගනිමින් විනයානුකූලව කටයුතු කර ජනතාවට සුභවාදි ඉතාම හොඳ තීරණ ගන්න සභාවක් කියලා. ඒ නිසා මට හරිම ආඩම්බරයි. අපේ මන්ත්‍රීවරුන්ගේ ගෞරවණීය හැසිරිම සම්බන්ධව, තවද පෞද්ගලික අංශයක් මඟින් මැදිහත් වී මියනුටු ආර වැව ආසන්නයේ හෝටලයක් ඉදි කිරිමට සභාවේ එකඟතාවය ඉල්ලා තිබෙන බවත් පවසන ලදි. ඒ සම්බන්ධ තත්වය විමසන ලදි. එහිදි ගරු උපසභාපතිවරයා සඳහන් කලේ මෙය වාරිමාර්ග දෙපාර්තමෙන්තුවට අයත් බැවින් ඔවුන්ගේ එකඟතාවය ලබාගෙන මේ සඳහා මැදිහත් විම සුදුසු බවයි.

ගරු ආර්.එම්.ඉන්ද්‍රාවති මැතිතුමිය

මෙම කොට්ඨාශයේ අ.පො.ස(සා.පෙළ) උසස් පෙළ හා විවිධ පාඨමාලාව හදාරපු තරුණ කොටස් රැකියා නැතුව ඉන්නවා. ඔවුන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් මෙම කොට්ඨාශයේ මහා පරිමාණ ව්‍යාපාර කරන ව්‍යවසායකයින් මඟින් කුමන හෝ රැකියා අවස්ථා සලසා දිමට හැකි නම් එය ඔවුන්ට කරන සත් කාර්යයක් බවත් ගරු මන්ත්‍රීවරුන් මේ සම්බන්ධයෙන් මැදිහත්ව කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු කේ.එම් වසන්ත රංජිත් මැතිතුමා

කොඩයාන මං සන්ධිය ඉතා ජනාකිර්ණ සහ හුවමාරු මං සන්ධි වශයෙන් අප හදුනාගෙන තියෙනවා. දෛනිකව 700-800ක් අතර ප්‍රමාණයක් මෙම මංසංදිය පසුකර යනවා. එහෙත් ඔවුන්ගේ සනිපාරක්ෂාව සඳහා ප්‍රමාණවත් වැසිකිළියක් නැහැ එය අත්‍යවශ්‍යයයි. දැනුම පර්චස් 09ක රජයේ ඉඩමක් ඒ ආසන්නයේ තියනවා . එම ඉඩම ලබාගෙන එහි වෙළඳ සැල්ද සහිතව පොදු වැසිකිළියක් හදන්න කටයුතු කරමු. පළමුව ඉඩම නිරවුල් කරගැනිමේ කටයුතු කරගන්නා ලෙසත් ඉඩම ශුද්ධ පවිත්‍රා කිරිම හා අනෙකුත් කටයුතු සම්බන්ධයෙන් අපහට උදව් කල හැකි බවත් ඔහු පවසන ලදි.

එච්.එම් මහේෂ් ඉන්දික බණ්ඩාර මැතිතුමා

උදැසන ඇතිමලේ හා කොටියාගල දක්වා යොදා ඇති බස් රථවලින් එම ප්‍රදේශයේ පාසල් වල ගුරුවරු හා ළමුන් පැමිණෙනවා. එහෙත් මෑතක සිට එම බස්රථ සේවාව නිසි පරිදි සිදු නොවන බව පේනවා. විශේෂයෙන් පාසල්වලට ගුරුවරුන් පැමිණෙන විට පෙ.ව 9.00 පමණ වෙනවා. මෙම තත්වය තුල අධ්‍යාපන කටයුතු අඩාල වෙනවා. එබැවින් එම බස්රථ පෙ.ව 6.00 ධාවනයට එක් කරන ලෙසත් එවිට නියමිත වේලාවට පැමිණිය හැකි බවත්, ඒ බව දන්වා යවන ලෙසත් ඉල්ලන ලදි. ප්‍රදේශයේ ජනප්‍රිය පාසලක්ව තිබූ විලඔය ශ්‍රීපාලි විදුහලට ප්‍රමාණවත් ගුරුවරුන් නැහැ. එලෙසම පහතආරාව විදුහලට පානීය ජලය නැහැ. වකුගඩු ආශ්‍රිත ගැටළු මේ නිසා ඇතිවන්න පුළුවන්. එම විදුහලේ පිට්ටනිය මැද කළු ගලක් තියනවා. එය ක්‍රීඩා කටයුතු වලට බාධාවක් වෙනවා. එය ඉවත් කිරිමට අආල අංශ දැනුවත් කරන්න. එලෙසම පුස්තකාලයද අබලන් බැවින් එයද පිළිසකර කළ යුතුයි. තවත් සැලකිය යුතු ප්‍රශ්නයක් තියනවා. එනම් ගලබොඩ පරම්පරාව යැයි කියමින් පාර්ශවයක් පහත ආරාව ප්‍රදේශයේ ඉඩමක් අතපත් කර ගැනිමට කටයතු කර තිබෙනවා. එය ව්‍යාජ ඔප්පු සකස් කර සිදුකරන වැඩපිළිවෙලක් බව දැන ගන්න තිබෙනවා. ඒ පිළිබඳ සොයා බැලිය යුතුයි. තවද කඳුරුගොඩ ගම්මානයට යන ප්‍රවේශ මාර්ගය භාවිතා නොකරන ලෙස වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් වාරණයක් දමා තිබෙනවා. ඒ හේතුවෙන් පවුල් 35කට පමණ පහසුවෙන් ගමන් කිරිමට නොහැකි වෙනවා. ප්‍රශ්නගත

ඉඩම් ගැටළුව ලෙස හොඳින් බැලීමේදී එම වගා බිම් වල වන වගාව සිදු කරනවා කිව්වත් එම කටයුතු සිදු වෙන්නේත් නැති බව අපට පෙනෙනවා. කොට්ඨාශයේම විදුලි පහන් නැවත සවි කිරීමට කඩිනම් පියවර ගන්න යැයි නැවත ඉල්ලා සිටිනවා. මගේ කොට්ඨාශයේ අසරණ පවුල් 02ක් ඉන්නවා. ඔවුන්ට සාධාරණයක් ඉටුකල යුතුයි. වැසිකිළි පහසු කම් නැති අයද ප්‍රදේශයේ ඉන්නවා. අස්වැසුම නැති එහෙත් අසරණ පවුල් කිහිපයක්ද ඉන්නවා. ඔවුන් ගැන සොයාබැලීම අපගේ වගකීමයි. එසේම පහතඅරාව පොළ භූමිය සකස්කර භාවිතයට ගැනීම ඉතා වැදගත්. මයුරාගම මාර්ගයද පවුල් 80 ක් පමණ භාවිතා කරනවා. ගාමන්ට් යන ළමයි බොහෝමයක් මේ මාර්ගය භාවිතා කරනවා. වීථි ලාම්පු නොමැති නිසා අඳුරේ ගමන් කිරීමට සිදුවෙනවා. මේ පිළිබඳව අවධානය යොමු කර මෙම ප්‍රශ්න විසඳාදෙන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. එබැවින් ඊට අදාල සියලු ලිපි මම සභාගත කරනවා.

<u>ගරු කේ.ආර්.එම්.අමරවංශ මැතිතුමා</u>

අද දින ඉතාම සාධණීය ලෙස තීරණ ගැනීම ඉතාම අගය කොට සලකනවා. බෙදීමක් නොමැතිව ඉදිරිපත් කරන යෝජනා ගනු ලබන තීරණ මහජනතාවට පොදුවේ එකඟවිය හැකි අයුරින් ගන්නා තීරණ බැවින් පිටස්තරයින් පැමිණෙන පාර්ශවයන්ද මෙම සාධණීය තත්වය අගය කරනු ඇති. අපට පූර්ණ අත්දැකීම් නැතත් සාධණීය ලෙස කටයුතු කරනවා. අපගේ කාලය තුල ඉතා හොඳ ආදර්ශයක් ලබා දෙමින් සාර්ථක ගමනක් යමු. මේක අපි ජනතාව වෙනුවෙන් කළයුතුම දෙයකි.

<u>ගරු උප සභාපති පී.කේ.අසංක ඉඳුනිල් මැතිතුමා</u>

මෙවැනි අයුරින් සියළු දෙනා එකමුතුව කටයුතු කරන විට අපගේ ගෞරවනීය තත්වය පිළිබිඹු වෙනවා. ගලබොඩ පාර්ශවය මැදිහත් වීමෙන් කටයුතු කරන ඉඩම පිළිබඳව ගරු සභාපතිතුමා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා කිරීම මත එම ගැටළුව ඉඩම් ඇමති මැදිහත්ව නිරාකරණය කරන තෙක් තාවකාලිකව ඔවුන්ගේ මැදිහත් වීම නතර කිරීමට තීරණය කර ඇති බව දැනුම් දෙන ලදි. අපි වෙනස් විදිහට හිතලා කටයුතු කරන කණ්ඩායමක්. නිර්මාණශීලිව ජනතාවගේ ප්‍රගමණයට අප කවුරුත් කිසියම් හෝ මොහොතක පීඩිතයෙක් වෙලා ඉඳලා තියෙනවා. පීඩිතයන් ඉතාමත් අමානුෂිකව සූරාකන තත්වයක් පෙනේ. වරප්‍රසාද බෙදී යාමේදී විෂමතාවක් තියෙනවා. අධ්‍යාපනය, ළමා අයිතිවාසිකම් ආදී වශයෙන් ජයග්‍රාහී පරිසරයක් සැමට සැදීම අපගේ වගකීමයි. අපි ව්‍යවස්ථාපිත ආයතනයක් බැවින් අපි ඉතා වගකීමෙන් කටයුතු කර ආදායම් උත්පාදනය කර ජනතාව තලාපෙලා කටයුතු නොකර ඔවුන්ගේ අපේක්ෂා හා වරප්‍රසාද තහවුරු වන ලෙස කටයුතු කරමු. මෙලෙස කටයුතු කර අප ආදර්ශමත්ම ප්‍රාදේශිය සභාව බවට පත් කරමු. ඒ සඳහා ගරු සභාපතිතුමා අපට ඉතා හොඳ ආදර්ශයක් ලබා දෙනවා. ඒ නිසා එතුමාට ස්තූතිය පළ කර සිටිනවා. එබැවින් අද දින රැස්වීමට පැමිණි සියලු දෙනාට ස්තූතිය පළ කරනවා.

ඒ අනුව අද දින මහ සභාවේ කටයුතු ප.ව.2.00 ට අවසන් කරමින් මී ළඟට මහ සභාව 2025.07.25 දින පෙ.ව. 9.00ට පැවැත්වීමට කටයුතු යොදා ඇති බව සභාවට දන්වා සිටිමි. න්‍යායපත්‍රානුකූලව අද දින සභාවේ වැඩකටයුතු අවසන් කරනවා.

..................................................
ඩබ්.වී.සුසන්ත ප්‍රදීප් කුමාර,
සභාපති,
සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව.